# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළකරනු ලබන නිවේදනයයි

## 2020 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කළ අයදුම්කරුවන් වෙත කෙරෙන නිවේදනයයි

2020 වර්ෂයෙහි දී අ.පො.ස (උසස් පෙළ) විභාගය, නව සහ පැරණි විෂය නිර්දේශ යටතේ විභාග දෙකක් ලෙස පැවැත්වීමට නියමිත බව විභාග දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත කරන ලද දැනුම් දීමට අනුව 2011 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව සහ පැරණි විෂය නිර්දේශයන් යටතේ පෙනී සිටි සිසුන්ට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අංක 29/2012 දරන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියෝගය අනුව යමින්, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටින සිසුන් ද වෙනම කාණ්ඩ දෙකක් (two distinct populations) වශයෙන් සැලකීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලදි. ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගන්නා Z-අගය පදනම් කරගෙන 2020/ 2021 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමට භාවිත කළ යුතු ක්‍රමවේද පිළිබඳව නිර්දේශ කිරීම සඳහා නිපුණතා කමිටුවක් (Committee of Experts) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදි.

එහිදී, එම නිපුණතා කමිටුවෙහි නිර්දේශ පදනම් කර ගෙන, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 15 (vii) වගන්තියට අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ ද නිර්දේශ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පහත සඳහන් තීරණවලට එළඹුණු අතර, පහත සඳහන් ක්‍රමවේදය දැක්වෙන නිවේදනය 2020 ඔක්තෝම්බර් මස 07 වන දින දිනපතා පුවත්පත් වන ඩේලි නිවුස්, දිනමිණ, ලංකාදීප, තිනක්කුරල්, 2020 ඔක්තෝම්බර් මස 08 වන දින තිනකරන් යන පුවත්පත් සහ 2020 ඔක්තෝම්බර් මස 11 වෙනිදා සති අන්ත පුවත්පත් වන සන්ඩේ ඔබ්සර්වර්, සන්ඩේ ටයිම්ස්, සිළුමිණ, ලංකාදීප, තිනක්කුරල් සහ වාරමන්ජරී යන පුවත්පත්හි පළ කරන ලදි.

- 2020 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා **නව නිර්දේශය** යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී **පළමු සහ දෙවන වරට** අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ (Composite Average) ප්‍රතිශතය වේ.
- 2020 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා **පැරණි නිර්දේශය** යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2014 වසරේ සිට 2018 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී **තුන්වන වරට** අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ(Composite Average) ප්‍රතිශතය වේ.

මීට අමතරව ඉහත නිවේදනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි නිල වෙබ් අඩවියේ ද මහජනයාගේ අවධානය පිණිස පළ කරන ලදී.

තව ද, 2020/2021 අධ්‍යයන වර්ෂයට අදාළව 2021 මැයි මස නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා වන ප්‍රවේශ අත්පොතෙහි ඉහත දැක්වෙන නිවේදනයට අමතරව 2014/2015 අධ්‍යයන වර්ෂයෙන් පසුව හඳුන්වා දුන් පාඨමාලා සම්බන්ධයෙන් ඉහත සඳහන් කර ඇති ක්‍රමවේද අනුව සිසුන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ වසර 5 ක දත්ත නොමැති වීම හේතුවෙන්, එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම එකී වසර 5 තුළ අධ්‍යයන පාඨමාලා සඳහා දැනට පවතින දත්ත මත පමණක් පදනම්ව සිදු කරන බව සඳහන් කර ඇත.

ඒ අනුව 2014/2015 අධ්‍යයන වර්ෂයෙන් පසුව හඳුන්වා දුන් පාඨමාලා සඳහා දැනට පවතින දත්ත යොදා ගෙන දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ විශ්වවිද්‍යාලවලට 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගනු ලබන සිසුන්ගේ ප්‍රතිශත පහත පරිදි ක්‍රමවේදයන් දෙකක් යටතේ ගණනය කිරීමට නිපුණතා කමිටුව (Committee of Experts) විසින් නිර්දේශ කරන ලදි. ඒ අනුව එකී නිර්දේශ විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ ද නිර්දේශය පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

ඒ අනුව, 2014/2015 අධ්‍යයන වර්ෂයේ සිට 2018/2019 අධ්‍යයන වර්ෂය දක්වා වූ අධ්‍යයන වර්ෂ පහක කාල සීමාව තුළ හඳුන්වා දුන් පාඨමාලා සඳහා **නව නිර්දේශය සහ පැරණි නිර්දේශය** යටතේ දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන සිසුන්ගේ ප්‍රතිශතය, එකී පාඨමාලාවන් හඳුන්වා දුන් අධ්‍යයන වර්ෂයේ සිට 2018/2019 අධ්‍යයන වර්ෂය දක්වා **පවතින දත්ත මත පදනම්ව නව නිර්දේශය සඳහා පළමු සහ දෙවන වරට** අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සහ **පැරණි නිර්දේශය සඳහා තුන්වන වරට** අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන් පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ (Composite Average) ප්‍රතිශතය වේ.

තවද, 2019/2020 සහ 2020/2021 අධ්‍යයන වර්ෂ දෙක තුළ හඳුන්වා දුන් පාඨමාලා සඳහා **නව නිර්දේශය** සහ **පැරණි නිර්දේශය** යටතේ දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන සිසුන්ගේ ප්‍රතිශතය, 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට එකී පාඨමාලාවන්ට අදාළ "Uni-Code" කේත සඳහා නව හා පැරණි නිර්දේශය යටතේ වෙන වෙනම අයදුම් කළ සිසුන්ගේ ප්‍රතිශතය වේ.

ඒ අනුව, අ.පො.ස ( උසස් පෙළ ) ප්‍රධාන විෂය ධාරාවන්ට අදාළව විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා කිහිපයක 2020/2021 අධ්‍යයන වර්ෂයෙහි විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උක්ත ක්‍රමවේදයන්ට අනුව ගණනය කරන ලද ප්‍රතිශත පහත දැක්වේ.

| | වෛද්‍ය විද්‍යාව | | ඉංජිනේරු විද්‍යාව | | දන්ත ශල්‍ය විද්‍යාව | | කළමනාකරණය | | නීතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| දීප ව්‍යාප්ත කුසලතා පදනම | 83.9% | 16.1% | 95.2% | 4.8% | 87.1% | 12.9% | 98.2% | 1.8% | 99.0% | 1.0% |
| දිස්ත්‍රික් කුසලතා පදනම | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| 1. කොළඹ | 84.9% | 15.1% | 95.5% | 4.5% | 88.0% | 12.0% | 99.1% | 0.9% | 98.3% | 1.7% |
| 2. ගම්පහ | 78.3% | 21.7% | 90.9% | 9.1% | 80.0% | 20.0% | 97.5% | 2.5% | 100.0% | 0.0% * |
| 3. කළුතර | 61.0% | 39.0% | 77.8% | 22.2% | 50.0% | 50.0% | 96.4% | 3.6% | 96.5% | 3.5% |
| 4. මාතලේ | 57.4% | 42.6% | 83.8% | 16.2% | 60.0% | 40.0% | 92.6% | 7.4% | 96.0% | 4.0% |
| 5. මහනුවර | 77.1% | 22.9% | 89.4% | 10.6% | 81.7% | 18.3% | 97.4% | 2.6% | 97.0% | 3.0% |
| 6. නුවරඑළිය | 74.1% | 25.9% | 80.9% | 19.1% | 90.0% | 10.0% | 95.5% | 4.5% | 97.5% | 2.5% |
| 7. ගාල්ල | 67.0% | 33.0% | 87.8% | 12.2% | 70.0% | 30.0% | 96.2% | 3.8% | 96.0% | 4.0% |
| 8. මාතර | 62.5% | 37.5% | 89.0% | 11.0% | 90.0% | 10.0% | 86.2% | 13.9% | 95.0% | 5.0% |
| 9. හම්බන්තොට | 60.5% | 39.5% | 72.4% | 27.6% | 60.0% | 40.0% | 86.3% | 13.7% | 91.4% | 8.6% |
| 10. යාපනය | 87.7% | 12.3% | 96.9% | 3.1% | 100.0% | 0.0% * | 99.3% | 0.7% | 100.0% | 0.0% * |
| 11. කිලිනොච්චි | 81.3% | 18.7% | 97.1% | 2.9% | 60.0% | 40.0% | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 12. මන්නාරම | 80.0% | 20.0% | 92.7% | 7.3% | 80.0% | 20.0% | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 13. මුලතිව් | 70.0% | 30.0% | 88.0% | 12.0% | 40.0% | 60.0% | 96.6% | 3.4% | 100.0% | 0.0% * |
| 14. වව්නියා | 89.6% | 10.4% | 95.5% | 4.5% | 80.0% | 20.0% | 99.2% | 0.8% | 90.0% | 10.0% |
| 15. ත්‍රිකුණාමලය | 74.0% | 26.0% | 93.4% | 6.6% | 100.0% | 0.0% * | 96.6% | 3.4% | 95.0% | 5.0% |
| 16. මඩකලපුව | 81.5% | 18.5% | 94.7% | 5.3% | 80.0% | 20.0% | 99.7% | 0.3% | 96.7% | 3.3% |
| 17. අම්පාර | 72.6% | 27.4% | 90.5% | 9.5% | 50.0% | 50.0% | 97.2% | 2.8% | 97.5% | 2.5% |
| 18. පුත්තලම | 69.9% | 30.1% | 91.8% | 8.2% | 80.0% | 20.0% | 98.7% | 1.3% | 97.8% | 2.2% |
| 19. කුරුණෑගල | 68.5% | 31.5% | 81.9% | 18.1% | 73.3% | 26.7% | 93.4% | 6.6% | 93.5% | 6.5% |
| 20. අනුරාධපුරය | 65.2% | 34.8% | 84.5% | 15.5% | 90.0% | 10.0% | 91.5% | 8.5% | 92.0% | 8.0% |
| 21. පොලොන්නරුව | 66.1% | 33.9% | 86.5% | 13.5% | 40.0% | 60.0% | 93.9% | 6.1% | 92.0% | 8.0% |
| 22. බදුල්ල | 65.5% | 34.5% | 86.6% | 13.4% | 80.0% | 20.0% | 90.4% | 9.6% | 93.6% | 6.4% |
| 23. මොනරාගල | 53.8% | 46.2% | 82.5% | 17.5% | 40.0% | 60.0% | 83.9% | 16.1% | 96.0% | 4.0% |
| 24. කෑගල්ල | 55.8% | 44.2% | 83.0% | 17.0% | 30.0% | 70.0% | 93.5% | 6.5% | 95.0% | 5.0% |
| 25. රත්නපුර | 62.1% | 37.9% | 84.7% | 15.3% | 66.7% | 33.3% | 91.9% | 8.1% | 96.7% | 3.3% |

| | ඉංජිනේරු තාක්ෂණවේදය (ET) | | ජෛවපද්ධති තාක්ෂණවේදය (BST) | | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | |
|---|---|---|---|---|---|---|
| | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| දීප ව්‍යාප්ත කුසලතා පදනම | 95.2% | 4.8% | 96.1% | 3.9% | 96.4% | 3.6% |
| දිස්ත්‍රික් කුසලතා පදනම | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| 1. කොළඹ | 100.0% | 0.0% * | 95.2% | 4.8% | 98.4% | 1.6% |
| 2. ගම්පහ | 98.2% | 1.8% | 96.1% | 3.9% | 93.2% | 6.8% |
| 3. කළුතර | 91.7% | 8.3% | 92.6% | 7.4% | 87.8% | 12.2% |
| 4. මාතලේ | 95.8% | 4.2% | 95.5% | 4.5% | 100.0% | 0.0% * |
| 5. මහනුවර | 90.0% | 10.0% | 91.9% | 8.1% | 94.4% | 5.6% |
| 6. නුවරඑළිය | 93.2% | 6.8% | 97.5% | 2.5% | 100.0% | 0.0% * |
| 7. ගාල්ල | 98.2% | 1.9% | 89.6% | 10.4% | 92.9% | 7.1% |
| 8. මාතර | 97.5% | 2.5% | 91.7% | 8.3% | 95.5% | 4.5% |
| 9. හම්බන්තොට | 86.8% | 13.2% | 88.2% | 11.8% | 100.0% | 0.0% * |
| 10. යාපනය | 91.7% | 8.3% | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 11. කිලිනොච්චි | 100.0% | 0.0% * | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 12. මන්නාරම | 100.0% | 0.0% * | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 13. මුලතිව් | 66.7% | 33.3% | 100.0% | 0.0% * | 50.0% | 50.0% |
| 14. වව්නියා | 90.0% | 10.0% | 100.0% | 0.0% * | 83.3% | 16.7% |
| 15. ත්‍රිකුණාමලය | 91.7% | 8.3% | 95.5% | 4.5% | 92.9% | 7.1% |
| 16. මඩකලපුව | 96.9% | 3.1% | 100.0% | 0.0% * | 100.0% | 0.0% * |
| 17. අම්පාර | 92.9% | 7.1% | 81.6% | 18.4% | 90.0% | 10.0% |
| 18. පුත්තලම | 98.0% | 2.0% | 95.2% | 4.8% | 92.3% | 7.7% |
| 19. කුරුණෑගල | 96.2% | 3.8% | 95.9% | 4.1% | 92.7% | 7.3% |
| 20. අනුරාධපුරය | 79.6% | 20.4% | 83.3% | 16.7% | 78.5% | 21.5% |
| 21. පොලොන්නරුව | 92.3% | 7.7% | 95.5% | 4.5% | 85.7% | 14.3% |
| 22. බදුල්ල | 90.0% | 10.0% | 97.8% | 2.2% | 96.4% | 3.6% |
| 23. මොනරාගල | 85.7% | 14.3% | 96.2% | 3.8% | 100.0% | 0.0% * |
| 24. කෑගල්ල | 92.9% | 7.1% | 97.4% | 2.6% | 85.9% | 14.1% |
| 25. රත්නපුර | 92.4% | 7.6% | 90.0% | 10.0% | 88.6% | 11.4% |

- සංයුත මධ්‍යකයන් (**composite average**) ප්‍රතිශතය 0.0% වන අවස්ථාවේදී දිස්ත්‍රික්කය සඳහා එක් ස්ථාන සංඛ්‍යාවක් ලබා දෙනු ලැබේ.

සෙසු පාඨමාලාවන් සඳහා ද අදාළ ප්‍රතිශත ඉහත සඳහන් ක්‍රමවේදයන්ට අනුව ගණනය කර ඇත. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසීම් කළ හැක.

ඒ අනුව, 2020 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසුන් විසින් ලබා ගත් Z-අගය පදනම් කරගෙන 2020/2021 අධ්‍යයන වර්ෂයේ සියලු විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම ඉහත සඳහන් කරන ලද ක්‍රමවේදයන්ට අනුව ගණනය කළ ප්‍රතිශතවලට සහ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා 2021 මැයි මස දී නිකුත් කළ **"ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය"** යන අත්පොතෙහි ඇතුළත් නීතිරීතිවලට යටත්ව සිදු කෙරෙනු ඇත.

**සභාපති,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**2021.09.21**